සන්නස
SANNASA

# වර්ෂ 2020 අලුත් අවුරුදු නැකැත් සීට්ටුව මෙල්බන් නගරය.

**ශ්‍රී ලංකා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ නැකැත් මූලාශ්‍ර පරිගණිමින් ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවරට ගැලපෙන ලෙස සකස් කරන ලදී.**

## නව සඳ බැලීම.

අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා 2020 මාර්තු මස 26 වන බ්‍රහස්පතින්දා දිනද අභිනව සූර්ය වර්ෂය සඳහා 2020 අප්‍රේල් මස 26 වන ඉරිදා දිනද සුභවේ.

## පරණ අවුරුද්ද සඳහා ස්නානය

වර්ෂ 2020 අප්‍රේල් මස 11 වන සෙනසුරාදා දින නුග පත් මිශ්‍ර නානු ගා ස්නානය කොට ඉෂ්ට දේවතා අනුස්මරණය කිරීම මැනවි.

අලුත් අවුරුදු උදාව මෙල්බන් නුවර
2020 අප්‍රේල් මස 13 වන සඳුදා දින රාත්‍රී 12.53ට නොහොත් 14වන අඟහරුවාදා උදෑසන

## පුණ්‍ය කාලය

වර්ෂ 2020 අප්‍රේල් මස 13 සඳුදා දින අපරභාග 6.29 සිට වර්ෂ 2020 අප්‍රේල් මස 14 වන අඟහරුවාදා පූර්වභාග 7.17 දක්වා පුණ්‍ය කාලය පවතී.

අපරභාග 6.29 ට පෙර සියලු වැඩ අතහැර ආහාර පාන ගෙන ආගමික වත්වත්වල යෙදීමට පුණ්‍ය කාලයේ අපර කොටස තුළ එනම් වර්ෂ 2020 අප්‍රේල් මස 13වන සඳුදා රාත්‍රී 12.53 සිට අප්‍රේල් 14වන අඟහරුවාදා පූර්ව භාග 7.17 දක්වා පහත පරිදි නැකැත් කටයුතු කිරීම මැනවි.

## ආහාර පිසීම

වර්ෂ 2020 අප්‍රේල් මස 14 වන අඟහරුවාදා දින පූර්වභාග 2.35ට ස්වේත වර්ණ හෙවත් සුදු පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා ලිප්බැඳ ගිනි මොළවා දී කිරි මිශ්‍ර කිරිබතක්ද තල මිශ්‍ර කැවිලි වර්ගයක් සහ අග්ගලා පිළියෙල කරගැනීම මැනවි.

## වැඩ ඇල්ලීම හා ආහාර අනුභවය.

වර්ෂ 2020 අප්‍රේල් මස 14වන අඟහරුවාදා දින පූර්ව භාග 3.46ට ස්වේත වර්ණ හෙවත් සුදු පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා සියලු වැඩ අල්ලා ගනුදෙනු කොට ආහාර අනුභවය කිරීම මැනවි.

## හිසතෙල් ගෑම.

වර්ෂ 2020 අප්‍රේල් මස 15වෙනි බදාදා පූර්වභාග 10.01ට හරිත වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා හිසට කොහොඹපත් ද, පාදා කොහොඹපත් මිශ්‍ර නානුද තෙල්ද ගා ස්නානය කිරීම මැනවි.

## රැකිරක්ෂා සඳහා පිටත්වීම

වර්ෂ 2020 අප්‍රේල් මස 17වන සිකුරාදා දින පූර්වභාග 8.43ට ලා නිල් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී කහුරු සහ තල මිශ්‍ර කිරිබතක් අනුභව කර නැගෙනහිර දිශාව බලා පිටත්ව යෑම මැනවි.

ඇපා පාරම්පරික ජ්‍යොතිෂඥ
**ආචාර්ය ධනංජය ඇපා**

From Page No. 35

# CORONA VIRUS INFECTION

There is no specific treatment for coronaviruses.
Antibiotics are not effective against viruses. Most of the symptoms can be treated with supportive medical care.

### Should I wear a face mask?

You do not need to wear a mask if you are healthy. While the use of masks can help to prevent transmission of disease from infected patients to others, masks are not currently recommended for use by healthy members of the public for the prevention of infections like coronavirus.

More information
For the latest advice, information and resources, go to www.health.gov.au
Call the National Coronavirus Health Information Line on 1800 020 080. It operates 24 hours a day, seven days a week. If you require translating or interpreting services, call 131 450.
The phone number of your state or territory public health agency is available at www.health.gov.au/state-territory-contacts
If you have concerns about your health, speak to your doctor.

Health Authorities update the latest situation weekly about who needs to be tested, isolated etc.. please be alert about that

***Latest Update as of 21/02/2020 at the time of writing this letter***

### Case Definition Update

The CDNA National Guidelines for Public Health Units was updated this week to include a revised case definition as follows;

***"Person under investigation"***

It is recommended that clinicians should consider testing people with a clinically compatible illness who travelled to any of the following countries in the 14 days before onset of symptoms:

- Hong Kong
- Indonesia
- Japan
- Singapore
- Thailand

The recommendation does not apply to passengers who have only been in transit through an airport in these countries.

If a clinician determines that a person under investigation should be tested then that person must be managed as a suspect case.

Please check the Dept. of Health guidelines <https://www1.health.gov.au/internet/main/publishing.nsf/Content/cdna-song-novel-coronavirus.htm> or your State Health resources for more information.

## චීනී හෙට්ටිගොඩ

